# වැඩ කරන ස්ථානයෙහි සදාචාරමය නීතීන්

ඇමරිකා එක්සත් ජනපදය සහ වෙනත් දේශයන්හි වැඩපලවල දැඩිය මහන්සිය සූරාකන සංස්ථානවලට අදාල ප්‍රශ්න වලට ඇපරල් කර්මාන්ත සහයෝගතාවය ප්‍රාථමික ස්ථානයක් දෙයි. මෙම පරීක්ෂණය යටතේ එම හවුල් සහයේගතාවය විධිමත් සහ මානවතවාදී වූද, ශ්‍රේෂ්ඨවූද, පහත සඳහන් නීතීන් සකස් කොට ඇත. මෙම සහයෝගතා යටතේ, පාරිභෝජිකයින්ට, නිෂ්පාදිත භාණ්ඩ පිළිබඳව හොඳ විශ්වාසයක්ද, ඒවා අමාන විය වූද, දැඩිය මහන්සිය සූරාකන තත්‍වයන් යටතේ සූදානම් නොකරන ලද බවට විශ්වාසයක් ඇතිවනු නියතය.

<u>බලයෙන් වැඩගැනීම</u> - හිරගෙදරකවැනි කම්කරු සේවයකු, දාස කම්කරුවෙකු, සවාමියාට ඔජපුවක් හෝ පොරොන්දු පත්‍රයක් පිට හෝ වැඩ කිරිමට බැදිඇති කමකරුවෙකුගෙන් හෝ වේවා, කිසියම් බලප්‍රයෝරයෙන් වැඩ නොගනු ලැබේ.

<u>ළමා කම්කරුවෝ</u> - වයස පහළොවට අඩු (සමහර රටවල නීතිය අනුව වයස 14ක අනුමැතිය[8]), එවගේම පොදු අධ්‍යාපනයක් අවශය රටවල වයස අවුරුදු පහලවට අධික වියහැකි ළමයින් වැඩ සඳහා යොදවා නොගනු ලැබේ.

<u>හිරහැර කිරිම හෝ අනීසි ව්‍යවහාරයන් කිරිම</u> - සෑම කම්සරුවෙක්ම ගෞරවයෙන් සහ සම්මානයෙන් සලකනු ලැබේ. කිසිම කම්කරුවෙකුට ශාරීරික, මානසික, වාචික සහ ලිංගිකමය වශයෙන් හිරිහැර කිරිමක් හෝ අනිසිව්‍යවහාරයක් නොකරනු ලැබේ.

<u>වෙනස්කම් නොකිරිම</u> - කිසිම කම්කරුවෙකුට, වයස, ලිංගික භාවය, ජාතිය, ආගම, පුරවැසිභවය, සාමාජික භවය, හෝ දේශපාලනීක අදහස් මත, රැකියා නීතිරීති, වේතනය, ප්‍රතිලාභ, ප්‍රගති, සංවරභවය, රැකියාවෙන් අස්කිරිම සහ විශ්‍රාම ලැබිම යන කිසිම කරුණක් උඩ වෙනස්කම් නොකරනු ලැබේ.

<u>සෞඛ්‍යය සහ ආරක්ෂාව</u> - වැඩකරන අවස්ථාවෙහි ලා හෝ සවාමිය, විසින් සපයන ලද පහසුකම් ක්‍රියාත්මක කිරිමෙහිලා අනතුරක් හෝ සෞඛ්‍යයට හානියක් ඇතිනොවන අයුරින් වැඩ කෙරෙන්නට වගබලාගැනිම සහ එයට යෝග්‍ය පරිසරයක් කම්කරුවන්ට සවාමිය, විසින් සපයනු ලැබේ.

<u>සාමාජික සහ සාමුහික සහයෝගත සහ ක්‍රියාකලාපයන් -</u> සාමාජික සහ සාමුහික සහයෝගත සහ ක්‍රියාකලාපයන් සඳහා කම්කරුවෙන්ගේ අයිතිවාසිකම, සවාමිය, පිළිගනු ඇති අතර, ගෞරවද කරනු ඇත.

<u>වේතනය සහ ප්‍රතිලාභ</u> - වේතනය, කරකරුවන්ගේ අවශයතාවයන් සපුරාලීමට අවශ්‍ය කරුණක් බව, සවාමියා පිළිගතයුතුය. ඒඅනුව ස්වාමිය විසින් නීතිය අනුව ස්ථිර කරන ලද අවම වේතන ප්‍රමාණයක් හෝ කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්තමාන වේතනය අතුරින් වැඩියෙන් ස්ථිර කරනු ලබන වේතන ප්‍රමාණය දියයුතුවන අතර, නීතිය මගින් ස්ථිර කරන ලද ප්‍රතිලාභයන්ද දිය යුතුය.

<u>වැඩකිරිමේ පැයගණන</u> - අතිවිශිෂධ ව්‍යාසාරික අවශ්‍යතවයන් හැරුණුවිට, (1) කිසිම කම්කරුවෙක් සතියකට පැය (ක)හතලිස් අටකට අධික සහ අතිරේක පැය 12ට අධිකව වැඩ නොකරනු ඇත. (ඛ)නීතිය අනුව වැඩ කිරීමේ පැයගණන සථිර නොකරන ලද රටවල වැඩකිරිමේ සීමාව සතියේ

[8] මෙම නීති මාලාවට සෑම රටකම ප්‍රාදේශිය නීතිරීති ඇතුලත් වනු ඇත.

සාමාන්‍ය වැඩකරන පැය ගණනද, අතිරේක වැඩකරන පැය දෙළහට අමතරව, (2) සතියේ දින හතෙන් එක්දිනයක නිවාඩුවක්ද කම්කරුවාට දියයුතු වන්නේය.

<u>අතිරේක පැයගණනට ගෙවීම්</u> - වැඩකරන සාමාන්‍ය පැයගණනට අමතරව, අතිරේක පැය ගණනට, නිෂ්පාදන ව්‍යාපාරයන් ගෙනයනු ලබන සැමරටකට ආවේණික වු නීතිරීති අනුවද, එවැනි නිතිරීති පණවා නොමැති රටවල, ඔවුන් වැඩකරන සාමාන්‍ය වේතනය අනුව, පැයගණනට ගෙවීම් කලයුතු වන්නේය.

*   *   *

වැඩකරන ස්ථානයේ සදචාරමය නීතිරීති අනුමත කරන සහ ක්‍රියාත්මක කරන ඕනෑම කොම්පැනියක් හෝ සමාගමක්, රටේ නිෂ්පාදන නීතිරීති පිලිපැදීමට අමතරව, එයට අදාලවු ප්‍රතිපත්තින්ද පිලිගත යුතුය. මෙයට අමතරව මෙම කොම්පැනිය හෝ සමාගමට තමන්ගේ ව්‍යාපාරයට අදාලවු බලපත්‍ර සහකොන්ත්‍රාත් කරුවන් අවශය වන අතර ඔවුන්ද එම සදචාරමය නීතින් සහ එයට අදාල වු ප්‍රතිපත්කින් ඉහලින් පිලිගත යුතුය.